Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## නර්තනය

**නම/විභාග අංකය :-** ................................................................................ **කාලය : පැය 02 යි.**

## I කොටස

- **1 - 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. කමතේදී බැත එකතු කිරීම, බැත හුළං කිරීම වී පෙළීම ආදී කටයුතු නිරූපනය කෙරෙනුයේ.... නැටුමේදීය එය.

   1. කුලු   2. ගොයම් කැපීම   3. පන්නෙළීම   4. මෝල්ගස්

2. ''සඳවට තරුවැල් ඇවිදින් කළ එලි සද්දේ...'' මෙම කවිය,

   1. කුළු නැටුමේ කවියකි.   2. ගොයම් කැපීමේ නැටුමකි.
   3. තාලම් නැටුමේ කවියකි.   4. ලී කෙළි නැටුමේ කවියකි.

3. සෙලවීමෙන් හා පිඹීමෙන් හඬ උපදවා ගත හැකි විකල්පවාද්‍ය උපකරණයක් වන්නේ,

   1. මාර ඇට දමූ ප්ලාස්ටික් බෝතලය, පැපොල් බටනලාව
   2. වතුර පුරවන ලද වීදුරු බෝතලය, පැපොල් බටනලාව
   3. ලීයක් සවිකළ පොල්කටු දෙකක්, බැලුම් බෝලය
   4. ගල් කැට දමූ වීදුරු බෝතලය, ටොනික් පියන් වළල්ල

4. ළමා ලියෝ ගවසා මල් වරළ පිට ... යන කවිය ගායන කළ හැකි තාල රූපය වන්නේ,

   1. 1́ 2 | 1́ 2   2. 1́ 2 3 | 1́ 2 3   3. 1́ 2 3 4 | 1́ 2 3 4   4. 1̂ 2 | 1́ 2 3

5. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන දවුලේ සම්මත දිග ප්‍රමාණය,

   1. අඟල් 18   2. අඟල් 12
   3. අඟල් 10   4. අඟල් 15 යි

6. දේශීය නර්තනයේ මූලික අංගහාරය......................... නමින් හැඳින්වේ.

   1. කෙන්ඩිය   2. පංචාංගය
   3. මණ්ඩිය   4. පදපහත්තිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

7. 1̂ 2 | 1́ 2 3 යන තාල රූපය.................. නමින්ද හැඳින්වේ.

1. සුළු මැදුම් දෙතිත
2. සුළු මහ දෙතිත
3. මැඳුම් මහා දෙතිත
4. මහ තනිතිත

8. පහතරට නර්තන ශිල්පය ප්‍රගුණ කළ ආධුනිකයකු ඔහුගේ මුල් ම ශිල්ප දැක්වීමේ අවස්ථාව හඳුන්වන්නේ,

1. මඩු බැසීම
2. ගුරුවරම් දීම
3. කලඑළි මංගල්‍යය
4. හළං වැඩීම

9. රාමසාන් උත්සවයෙන් අවසන් කරනු ලබන උපවාස ශීලය, ආරම්භ කරනු ලබන්නේ,

1. අප්‍රේල් මාසයෙහි ය.
2. ජුනි මාසයෙහි ය.
3. ජූලි මාසයෙහි ය.
4. ජනවාරි මාසයෙහි ය.

10. ශාන්තිකර්ම සැරසිලි සඳහා බහුලව භාවිත කරනු ලබන්නේ,

1. ලී කෝටු, නාගවල්ලි කොළ
2. පොල්කොළ, අඹකොළ
3. ගොප් කොළ, කෙසෙල්බඩ
4. ඉරටු, ලී කෝටු

(ලකුණු 2 x 10 = 20)

● **11 සිට 15 දක්වා ප්‍රශ්නවල හරි නම් √ ලකුණ වැරදි නම් වැරදි x ලකුණ ඉදිරියෙන් ඇති වරහන් තුළ ලියන්න.**

11. අල් කුරාණය මුස්ලිම් ජාතිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථයයි. ( )

12. පෙරහර සමය ආරම්භ වන්නේ බක්මාසයෙනි. ( )

13. කලඑළි මංගල්‍යයට පෙර නිර්මාංශ වීම චාරිත්‍රයකි. ( )

14. සුළු තනි තිතට අයත් මාත්‍රා සංඛ්‍යාව දෙකකි. ( )

15. සමූහ වාදනයකදී සම්ප්‍රදායික භාණ්ඩ පමණක් වාදනය කළ යුතු ය. ( )

A කොටසට වඩාත් ගැළපෙන පිළිතුර B කොටසින් සොයා ඊ තල මඟින් යා කරන්න.

| | **A** | **B** |
|---|---|---|
| 16 | හත් අඩියේ පියුම | දවුල |
| 17 | පා සරඹ | පෙරහර |
| 18 | කඩිප්පුව | ගොප් කොළ |
| 19 | මොර, හිඹුටු දං පනා | දණ්ඩිකද |
| 20 | තූර්ය වාදනය | සුළු මැදුම් දෙතිත |

(ලකුණු 2 x 5=10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

● ප්‍රශ්න 4 ක් පමණක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

1. i. සුළු මැදුම් දෙතිතට අයත් බෙර පදයක් ලියන්න. (ලකුණු 3)
   ii. තුරගා වන්නමේ කවියක් ලියන්න. (ලකුණු 5)
   iii. කුළු නැටුමකට අයත් කවියක පද දෙකක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

2. i. දවුල වාදනය කරන අවස්ථා 3 ක් ලියන්න. (ලකුණු 3)
   ii. දවුල සෑදීමට යොදාගන්නා අමුද්‍රව්‍ය 5 නම් කරන්න. (ලකුණු 5)
   iii. දවුලෙහි රූප සටහනක් ඇඳ කොටස් 4 ක් නම් කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

3. i. දේශීය නර්තන සම්ප්‍රදායන්හි ශිල්ප හදාරා කළඑළි බසින අවස්ථාවේ සිදුකරන සුවිශේෂි චාරිත්‍ර 3ක් ලියන්න. (ලකුණු 3)
   ii. නර්තන කලාව හා සම්බන්ධ සාරධර්ම 2 ක් ලියන්න. (ලකුණු 5)
   iii. කලඑළි මංගල්‍යය / මඩු බැසීම / ගුරුවරම් දීම මින් එක් මාතෘකාවක් තෝරාගෙන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

4 i. රාමසාන් උත්සවය පවත්වන රටවල් 3 ක් නම් කරන්න. (ලකුණු 3)
   ii. මුස්ලිම් බැතිමතුන් උපවාස ශීලය රකින කාලයේදී පිළිපදින චාරිත්‍ර 2 ක් ලියන්න. (ලකුණු 5)
   iii. රාමසාන් උත්සවයේදී අනුගමනය කරන ක්‍රියාවන් විස්තර කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

5. i. පා සරඹ / මණ්ඩි පද නැටීමේ ඇති ප්‍රයෝජන 3 ක් ලියන්න. (ලකුණු 3)
   ii. ඔබ ඉගෙනගත් තුන්වන ගොඩ සරඹය / ඉලංගම් සරඹය / දොඹින පදය ලියා එහි කස්තිරම / ඉරට්ටිය / කලාසම ලියන්න. (ලකුණු 5)
   iii. පෙරහරක වාදනය කිරීමට සුදුසු බෙර පද 2 ක් ලියන්න, එක් සරඹ පදයක් ප්‍රස්ථාර සටහනක දක්වන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

6. i. මින් මාතෘකා 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   1. කළගෙඩි නැටුම  2. ශාන්තිකර්ම සැරසිලි
   3. විකල්ප වාද්‍ය උපකරණ  4. පෙරහර
   (ල. 5 බැගින් මුළු ලකුණු 15)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Answers

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය

## නර්තනය - පිළිතුරු පත්‍රය

I කොටස

1. කුලු 2. තාලම් නැටුමේ කවිය 3. මාර ඇට දැමූ ප්ලාස්ටික් බෝතලය,පැපොල් බට නලාව
4' 1 2 3/1 2 3 5. අඟල් 15 6. මණ්ඩිය/මැණ්ඩිය 7. සුළු මැදුම් දෙතිත
8. මඩු බැසීම 9. ජූනි මාසයේ ය. 10 ගොප්කොළ, කෙසෙල් බඩ (ලකුණු 2 x 10 = 20)

11. √ 12. X 13. √ 14. √ 15. X (2 x 5 = 10)

| | | |
|---|---|---|
| 16 හත්අඩියේ පියුම | - | ගොප්කොළ |
| 17 පා සරඹ | - | දණ්ඩිකඳ |
| 18 කඩිප්පුව | - | දවුල |
| 19 මොර හිඹුටු දං පනා | - | සුළු මැදුම් දෙතිත |
| 20 තූර්ය වාදනය | - | පෙරහර (2 x 5 = 10) |

II කොටස

1. i. අදාළ බෙර පදය ලියා ඇත්නම් (ලකුණු 3)
ii. කවිය සඳහා (ලකුණු 5)
iii. ඕනෑම කුළු කවියක් අදාළ තිතට ප්‍රස්තාර කර ඇත්නම්
කවි පද (ලකුණු 5) නිවැරදි විභාග තාල සංකේත (ලකුණු 2) ( ලකුණු 7)
(ලකුණු 15)

2. i. වාදන අවස්ථා සඳහා (ලකුණු 3)
ii. අමුද්‍රව්‍ය 5ක් නම් කිරීම (ලකුණු 5)
iii. රූප සටහනට (ලකුණු 3) කොටස් නම් කිරීමට (ලකුණු 4) (ලකුණු 7)
(ලකුණු 15)

3. i. චාරිත්‍ර 3 ක් සඳහා (ලකුණු 3)
ii. සාරධර්ම 2ක් සඳහා ල. 2 1/2 x 2 = 5)
iii. කෙටි විස්තරයේ කරුණු 3 හෝ ඊට වැඩි නම් (ලකුණු 7) (ලකුණු 15)

4. i. රටවල් 3 ක් සඳහා (ලකුණු 3)
ii. චාරිත්‍ර 2 සඳහා ල 2 1/2 x 2 = 5
iii. විස්තර සඳහා කරුණු 3 ක් හෝ ඊට වැඩි නම් ලකුණු (ලකුණු 7) (ලකුණු 15)

5. i. ප්‍රයෝජන 3 ක් ලියා ඇත්නම් (ලකුණු 3)
ii. ගොඩ සරඹ පදය (ලකුණු 2)
කස්තිරම / ඉරට්ටිය / තලාසම (ලකුණු 3)
iii. ජෙං ජෙග ජෙග තකට තකට
කුඳ කුඳ කුඳ තකට තකට
දොංත තකට තක් කුඳ කුඳ
කුඳට ගතට ගතට ගජිං වැනි බෙර පද හෝ ආදේශ බෙරපද 2 ක් ලියා ඇත්නම් (ලකුණු 03)
ප්‍රස්තාර කිරීම (ලකුණු 04) (ලකුණු 15)

6. වාක්‍ය 3 ක් හෝ ඊට වැඩියෙන් ලියා ඇත්නම් ලකුණු 5 ක් පිරිනමන්න. (5x3=15)